374 PER
UNIVERSITY OF PERADENIYA
2005-12-12
LIBRARY.

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාධාරී පාසල් ගුරුවරුන්ගේ ගුරු නිපුණතා

එස්.පී.සී. පෙරේරා *(විද්‍යාවේදී, අධ්‍යාපන ඩිප්ලෝමා)*

අධ්‍යාපන දර්ශනපති උපාධිය

පේරාදෙණිය විශ්ව විද්‍යාලය

1996/97

588548

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාධාරී පාසල් ගුරුවරුන්ගේ ගුරු නිපුණතා

එස්.ජී.සී. පෙරේරා

## සංක්ෂේපය

ඉහල මට්ටමක අධ්‍යාපන ඵලදායීත්වයක් පවත්වාගැනීම සඳහා ගුරුවරුන් වෙතින් ඉටු විය යුතුව පවතින වැදගත් කාර්යභාරය අපේක්ෂිත ලෙසින්ම ඉටුකරදිය හැකි ආකාරයේ වෘත්තීය නිපුණත්වයක් ඔවුනට ලබාදීම අත්‍යවශ්‍යය. ඒ සඳහා ලොව බොහෝ රටවල් නිපුණතා පාදක ගුරු අධ්‍යාපන හා පුහුණු ක්‍රම වෙත නැඹුරුවී ඇත. මෙරට ගුරුවරුන්ලෙස බඳවාගන්නා උපාධිධාරීන්ට අවශ්‍ය මූලික වෘත්තීය නිපුණතා ලබාදීමේ අරමුණින් දැනට වසර 50 කටත් පෙරාතුව සිට පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (ප.උ.අ.ඩි.) පාඨමාලාවක් පැවැත්වේ. එහෙත් මෙරට අධ්‍යාපන ඵලදායීත්වය දිගු කලක් තිස්සේ අසතුටුදායක තත්ත්වයක පවතී. ගුරු පුහුණුව අසාර්ථක ද, ගුරුවරු සිය වගකීම් හරි ආකාරව ඉටු නොකරන්නේ ද, නැතහොත් රජය අපේක්ෂා කරන අධ්‍යාපන ප්‍රගතිය කරා ළඟාවීමට අපහසුවී ඇත්තේ වෙනත් හේතූන් නිසා ද යනාදී ප්‍රශ්ණ මේනිසා ඉස්මතුවී පවතී.

අනෙක් ගුරුවරුන්ට සාපේක්ෂව සිය වෘත්තීයමය නිපුණතා බොහෝ දුරට ප්‍රගුණ කරගැනීමට අවස්ථාව ලත් අය ලෙස ප.උ.අ.ඩි. ගුරුවරුන් පිළිගැනෙන නිසා පංති කාමරයේ දී සිය ගුරු නිපුණතා ඔවුන් විසින් හොඳින් උපයෝගී කරගනු ලැබෙතැයි අපේක්ෂා කළ හැක. එබැවින් ප.උ.අ.ඩි. ගුරුවරුන් ඉගැන්වීමෙහි නිරතවූ අවස්ථා වල නිශ්චිත ගුරු නිපුණතා ලක්ෂණ නවයක් ප්‍රදර්ශනය වූ ආකාරය සහ එම ගුරුවරුන්ගේ කටයුතු සඳහා පාසල් සංදර්භය ආශ්‍රිත වෙනත් සාධක සමූහයක් බලපෑ ආකාරය අධ්‍යයනයට භාජනය කරන ලදී. ඒ අනුව සහභාගී නිරීක්ෂණය ප්‍රධාන ගුණාත්මක ප්‍රවේශයක් ඔස්සේ ගුරුවරුන් 48 ක් විසින් පැවැත්වූ පාඩම් වාර 188 ක් නිරීක්ෂණය කරන ලදී.

නිශ්චිත නිර්ණායක වලට අනුව අදාල ගුරු නිපුණතා ලක්ෂණ ගුරුවරුන් වෙතින් සතුටුදායක මට්ටමකින් ප්‍රදර්ශණය නොවීය. ගුරුවරු බහුතරයක් සිය ඉගැන්වීමේ කටයුතු දැනට වඩා විධිමත්ව ඉටුකළයුතුව පවතින බව දැන සිටියත් ඍණාත්මක ආකල්ප සහ වෘත්තියෙන් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳවවූ අතෘප්තිය ආදී හේතූන් දක්වමින් සිය වගකීම් පූර්ණව ඉටු නොකරන තත්ත්වයකට පත්ව සිටියහ. ගුරුවරයා ක්‍රියාකරණ පංතිකාමර සංදර්භය ආශ්‍රිත නිශ්චිත සාධක කිහිපයක් ද එම අයහපත් තත්ත්වය උදාකරලීම සඳහා යම්තාක් දුරකට දායකවී තිබුනි. ප.උ.අ.ඩි. ගුරු පුහුණුවේ ප්‍රායෝගික අංශය දුර්වල බව ගුරුවරු වැඩිදෙනෙක් ප්‍රකාශ කළ අතර එයද ගුරුවරුන්ගේ නිපුණත්වය හොඳින් ප්‍රදර්ශනය නොවීම සඳහාවූ එක් වැදගත් සාධකයක් වියහැක.

# Teaching Competencies of the School Teachers with Post-Graduate Diplomas in Education

**S.G.C. Perera**

## Abstract

Amongst the school teachers with various qualifications, those who posses Post-Graduate Diplomas in Education (PGDE) can be considered as a special group with necessary professional competencies. PGDE is the major teacher training course offered to the newly recruited graduates who do not have any theoretical knowledge or practical skills associated with teaching. This training has been offered to them for more than 50 years and the government is still relies on it. However, the productivity in education in Sri Lanka considered as very low. Some formal and non formal reviews and indicators like GCE examination results provide enough evidence to prove this point. In this background, the effectiveness of the teachers' performances can be questioned. Do the PGDE teachers also perform poorly? If it so, why? Is it due to deficiencies associated with PGDE course or outside factors? Thus an effort has been made to investigate how the PGDE teachers demonstrate their teaching competencies in their class rooms and the factors associated with the school environments which effect the teachers' performance.

The method of this research can be described as a *Qualitative Study*, based on the *Participant Observation* approach. Though this study is qualitative, some quantitative data also was incorporated with observed information to strengthen its' validity and reliability. The research field covered nine schools in two educational zones in Kandy district. The sample consisted with the 48 PGDE teachers. A total of 188 lessons conducted by them were observed.

Ability to show nine teaching competencies according to the defined characters were noted. Simultaneously, factors associated with the school environment, which had an effect for usage of those competencies were also recorded. Interviews with the teachers, self evaluations, inspection of the school premises and inspection of records/materials are some of the strategies used to verify the accuracy of the primary observations as recorded in the class rooms.

Analysis of data has shown that the PEDE teachers are unable to show their competencies satisfactorily while conducting the lessons. There was enough evidence to determine that the number of factors related to the context of classroom environment have considerable effect to suppress the use of competencies. It is also revealed that most of the PGDE teachers do not have a favorable attitude towards their job. Thus they ignore some of the essential components of their duties and make shortcuts just to finish tasks. Lack of recognition and benefits for qualified school teachers are also highlighted by the teachers as important aspects which limit their performance.

The researcher suggests that some essential facilities have to be provided in order to create a better classroom environment to make it more favorable for teaching. The researcher recommends re-organization of the PGDE course by putting more weight on practical teaching aspects as most of the PGDE teachers suggested.

(**Key Words** : Teacher, Competencies, Factors, Classroom, School, )